# හැඳින්වීම

කෑම්-බීම්, ඇඳුම්-පැළඳුම්, යෑම්-ඊම්, සිරිත්-විරිත් ආදී හැම දෙයක් මැ අපරදිග පන්නයට පුහුණු වැ සිටි අපේ බොහෝ දෙනා තමන් ගේ බස මුළුතැන් ගෙට දක්කා දැමූහ. මවු බසින් කතා කිරීම ඔවුනට මහා මදිකමෙක් වියැ. ඉංගිරිසි හඬින් ඉංගිරිසි ගීයක් කීම හැරැ ඔවුන් සතුටු කිරීමට සමත් වූ සගයුවෙක් (සංගීතයෙක්) හෙළ දිවැ පහළ නො වී යැ. ඇතැම්හු සරදමට මෙන්, පැල් කවි, කරත්ත කවි, සීපද, වන්නම් ආදිය "සිංහල සංගීතය" යි කියමින් ගයන්නට පටන් ගත් හ. එහෙත් ඒවා නිකමට කීවා විනා ඉන් සතුටු වූ බවෙක් නම් නො පෙනිණි. කරුණු මෙ සේ පවත්නා අතරැ රිදී වලාව පහළ වියැ. 'ඕලු පිපී-ලා', 'හඳ පානේ' වැනි ගීවලින් සිදු වූ මෙහෙය මම මැ කුමට කියම් ද? 'අප්පිරියාව' නිසා 'ඔක්කාරයට' ආ හෙළ පද දැන් යස රඟට අර ඉංගිරිසි කටින් පිට වෙයි. මවු බසින් ගී කීමට දැන් උහු පුරුදු වෙති. ම-ගේ මේ 'අලුත් සංගීතයෙන්' මා බලාපොරොත්තු වූ කරුණු අතුරින් එකෙකි, එය ද, ම-ගේ මඟට තවත් රැකුලෙකි, මේ එළි දකින කෝකිල නාදය හෙවත් සුනිල් හඬ. මා දුන් විරිත් අනු වැ හියුබත් දිසානායක කිවියාණෝ මේ ගී බැන්ද හ. මම ඒ ගීවලට තනු (tunes) යොදා ගයා වයා දැන් මෙ සේ ඔබ අතට පමුණුවමි.

මෙහි කිසිවක් ම-ගෙන් අවසර නැති වැ උපුටා-ගැනීම මුළු-මනින් මැ තහනම් බවත් මෙහි හැම හිමි කම් මා සතු බවත් ඉඳුරා පළ කෙරෙමි.

මේ පොත 'කෝකිල නාදය' යන නමින් පළ කැරවීමට මුලින් සිතා සිටි නමුත් මහා ජනයා මුළා කරන්නට සැරැසී සිටුනා ඇතැමුන් නිසා මෙය 'සුනිල් හඬ' යන නමින් මෙසේ පළ කරන්නට සිදු වූ බව සැලකත් වා.

1947 දෙසැම්බර් 20 වන දා  
කොල්ලුපිටියේ දී යැ.

මෙයට  
සුනිල් සාන්ත

# පෙර වදන

සුනිල් සාන්තයන් දඹදිවැ ගොස් මෙහි පැමිණි තැන් සිටැ මේ දක්වා ඔවුන් ගත් මඟ එවුන් කළ කී තාක් දෑ දෙසැ විමැසමු ඇසින් බලා සිටියෙමි. දඹදිවින් ලබා-ගත හැකි හැම මැ හපන්කම් හිමි කැරැ-ගත් ඔවුන්, දඹදිවට ගැති නොවූ, හෙළ සගයුවක් පණ ගස් වන්නට ගන්නා ඉමහත් දිරිය, ම-ගේ පමණක් නො වැ, දෑහිතැති හැම හෙළයකු ගේ මැ, මහත් සොම්නසට කරුණු යැ. සුනිලුන් ගේ එදිරිය දැන් හොඳින් පල දරන්නට පටන්-ගෙනැ සිටුනා සැටි මට පෙනේ. හෙළ සඟයුවක් ගැනැ දොඩන විටැ මහ උවහස් බැලුම් ලූ අපේ කුහුවෝ දැන් කුහුකම් මඳකට පසකට දමා සුනිලුන් ගේ ගී දෙසැ. ඔවුන් ගේ පිවිතුරු සගයුව දෙසැ මහ කුහුලින් නෙතුත් සිතුත් යොමති. එහි ලා ම-ගේ සොම්නස ඉම් ඉක්මැ-යෙන බව කුමට කියම් ද? සිය දිරියෙහි පල සිය දිවියෙහි දී මැ දක්නා සුනිලුනට මේ තත්හි දී කුමක් සිතෙනු ඇත් දැ යි ම-ගෙන් නොඇසුව මැනවි.

මම එකක් දනිමි. සුනිලුන් මේ කටයුතු ඇරැඹියා පමණෙකි. ඉදිරියට ඔවුන් අතින් කැරෙන්නට ඇති දෑ ඉතා බෙහෙවි. ඇරඹි තන්හි දී මැ මහ රැසක් රටට දෙන්නට සුනිලුනට පුළුවන් වූ බව සැබෑ නම්, ඔවුන් ගෙන් මතු සිදුවන්නට තිබෙන, සිදු වෙති යි ඉඳුරා සිතෙන දැයෙහි කො තරම් රසයෙක් ඇද්ද යනු සිතා-ගැන්ම ඒ තරම් මැ අමාරු නො වේ. සැබැයි, එ සේ වන්නේ අපේ රැස එයට සැරැසී සිටියොත් පමණකි. හෙළ රැසටත් හෙළ දෙසටත් එ මගින් මැ හෙළ බසටත් මහ වැඩ සසා ලීමේ මහ පිනක් ඇති වැ උපන් සුනිලුනට ඔවුන් ගත් මඟැ මහ දුරක් යන්නට සරසක් නැති වැ යන්නට - ලැබෙතොත් ලැබෙනුවයේ හෙළ රැසේ කොවක් උදවුව ද ලැබුණොත් යැ. ඒ උදවුව හැම කල්හි මැ නො අඩු වැ සුනිලුනට ලැබේ වා යි පතමි.

මෙහි ගී බැන්දා වූ හියුබත් දිසානායකයන් හෙළ බසේ මහ රහ මැනැවින් උරා එයට යළිදු රහ ගැන්වීමේ යෙදී සිටුනා කෙනෙකුත් බව මුළු රට පුරා පළ යැ. ඔවුන් මෙහි ලා දක්වා සමත්කම, සුනිලුනට පමණක් නො වැ, රස දත් සියල්ලනට, මහ දිරියක් බව ම හඳහමි.

2491 ඉල් මස අව 13　　　ජයන්ත වීරසේකර
මරදානේ දිරිබර්ග පෙත් මගේ
නම් වර 129/4 දරණ තැනැ දී යැ.